**පැෆ්රල්**

# පැෆ්රල් සංවිධානයේ නිවේදනය ( 2014 දෙසැම්බර් 18 )

## පසුබිම

ජනාධිපතිධූරය දැරූ අයෙකුට තෙවැනි වතාවටත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙමින් 2010 වර්ෂයේදී සම්මත කළ 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු පැවැත්වෙන පළමු ජනාධිපතිවරණය වන්නේ එළඹෙන හය වැනි ජනාධිපතිවරණයයි. වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂට එරෙහි ප්‍රධාන අපේක්ෂකයා ලෙස විපක්ෂයේ පක්ෂ බහුතරයක සහයෝගය ලබා ගෙන තිබෙන පාලක පක්ෂයේ හිටපු මහලේකම් වූ, එසේම ඇමති මණ්ඩල සාමාජිකයෙක් ද වූ මෛත්‍රීපාල සිරිසේන මහතා මතු වී තිබෙන තත්ත්වයක් තුළ මෙම මැතිවරණය තීරණාත්මක සහ ඉතාම තරඟකාරී මැතිවරණයක් වීමේ විභවයක් උසුලයි. මැතිවරණයට ඉදිරිපත් වී සිටින සෙසු අපේක්ෂකයින් 17 දෙනා විසින් ඇති කරන දේශපාලන බලපෑම සුලු එකක් වීම ලංකා ඉතිහාසයේ ජනාධිපතිවරණයන්ගේ සෙසු අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව සළකා බැලීමේදී පෙනී යයි. ඉහත කාරණයට අනුව **මෙවර ජනාධිපතිවරණය ද වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා අතරත් තිරණාත්මක තරඟයක් පවතිනු ඇතැයි**මේ නිසා දෙවැනි මනාපයකට තිබෙන වැදගත්කම නිෂ්ප්‍රභ වන අතර එතරම් ඡන්දදායක ප්‍රමාණයක් දෙවැනි මනාපය ලබා දෙනු ඇතැයි සිතිය නොහැක.

නොවැම්බර් 19 වන දා වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ තවත් ධූර කාලයක් සඳහා තේරී පත්වීමට තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස් වරයා විසින් 2014 නොවැම්බර් මස 20 වන දින අංක1889/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපතිවරණයක් පවත්වන බවට නිවේදනය කළ අවස්ථාවේ සිට පැෆ්රල් සංවිධානය වෙනත් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ සමගාමීව විධිමත් ලෙස මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කරමින් සිටී. ජනාධිපතිවරයාගේ ධූර කාලය අවසන් වීමට සැලකිය යුතු කාලයකට පෙර මෙම මැතිවරණය කැඳවන බවට අනුමාන කිරීම් පැතිරී ගොස් තිබූ තත්ත්වය තුළ නිල වශයෙන් ජනාධිපතිවරණ නිවේදනය කිරීමටත් පෙර පැෆ්රල් සංවිධානය මැතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා සූදානම් වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

## මැතිවරණ පදනම

මෙම මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමේ සුදුසුකම් ලැබූ ඡන්දදායකයින් සංඛ්‍යාව 15 044 490 කි. ඒ අතරින් ඡන්දදායකයින් 400 000 ක ප්‍රමාණයක් නිල ජාතික හැඳුනුම්පත් රහිත වූවන් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත,මැතිවරණයට පෙර ,අවම වශයෙන් එම ඡන්දදායකයින් අතරින් 40 000 කට ජාතික හැඳුනුම්පත් ලබා දීම සඳහා වූ උත්සාහයක පැෆ්රල් සංවිධානය ඇතුලු නිරීක්ෂණ සංවිධාන නියැලී සිටී. ඡන්දය ප්‍රකාශ කිරීමේ

අවස්ථාව ලබා ගැනීම සඳහා තාවකාලික හැඳුනුම්පත් ලබා ගන්නා ලෙස සෙසු පිරිස වෙත ඉල්ලීමක් ද නිකුත් කොට තිබේ.

**පැෆ්රල් සංවිධානයේ ව්‍යායාමය**

මැතිවරණ නීති උල්ලංඝණය කිරීම සහ බලය අවභාවිතා කිරීමට එරෙහි ප්‍රතිරෝධකයක් ලෙස ක්‍රියා කරන නිසා මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය අතිශයින් වැදගත්ය. පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂණ ව්‍යායාමයේ පෙරමුණු දෙකක් ඇත. පළමුවැන්න ඍජු නිරීක්ෂණ ක්‍රියාවලිය වන අතර දෙවැන්න හවුල්කරුවන් සමඟ සහයෝගීව ක්‍රියා කරමින් ඇති කරගන්නා විධිවිධානයන්ය.

ස්වකීය නිරීක්ෂණ ක්‍රියාවලියේ දී පැෆ්රල් සංවිධානය ස්ථානගත නිරීක්ෂකයින් 11 200 ක්, දිගුකාලීන නිරීක්ෂකයින් 335 ක්, ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 360 ක්, තැපැල් ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 1000 ක් සහ තැපැල් ඡන්ද සඳහා ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 35 ක් ද නිරීක්ෂණ කටයුතු සඳහා යොදවනු ඇත.

අවශ්‍යතාවය මත පැෆ්රල් සංවිධානය සමඟ ස්වේච්ඡාවෙන් කටයුතු කරන නීතිඥවරුන් හා ඒකාබද්ධ වී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සැළසුම් කර ඇති අතර පැෆ්රල් සංවිධානය තවමත් නීතිමය ක්‍රියාමාර්ගයකට එලැඹ නැත. එසේ වුවත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යනු අවශ්‍ය වූ විට අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ගයකි. මැතිවරණ නිරීක්ෂකයින් , පොලිස්පතිවරයා , මැතිවරණ කොමසාරිස්වරයා සහ මානව හිමිකම් කොමිසමේ සාමාජිකයින් අතර අඛණ්ඩ අන්තර් හුවමාරුවක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැලසීම ද පැෆ්රල් සංවිධානය විසින් සිදු කරයි.

පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂණ ක්‍රියාවලියේ තවත් වැදගත් පැතිකඩක් වන්නේ විශේෂයෙන්ම ආගමික නායකයින් ඇතුලත් වන ලෙස සිදු කෙරෙන ප්‍රජා මූල ක්‍රියාකාරීත්වයයි. පුරෝගාමී සිවිල් සමාජ සහ ආගමික නායකයින් 600 දෙනෙක් සඳහා වූ රැස්වීමක් 19 දින කොළඹදී පැවැතවීමට සැළසුම් කර ඇති අතර ප්‍රජා සාම සාධක කණ්ඩායම් ලෙස ඔවුන් සවිබල ගැන්වීම එහි පරමාර්ථයයි. පැෆ්රල් සංවිධානයේ ජංගම නිරීක්ෂණ ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ සාමාජිකයින් සම්බන්ධ කරගැනීමට ආගමික නායකයින් සමඟ දැනටමත් එකඟතාවයක් ඇති කර ගෙන තිබේ.

මැතිවරණ කොමසාරිස්වරයා , පොලිස්පතිවරයා , මානව හිමිකම් කොමිසම , අල්ලස් කොමිසම සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ බලපෑම් කණ්ඩායම් ලෙස ක්‍රියා කිරීම සඳහා පුද්ගලික ව්‍යාපාර අංශය නියෝජනය කරන වෘත්තීය සමිති සහ සිවිල් සමාජය සමඟ ඇති කරගනු ලබන උපාය මාර්ගික හවුල්කාරීත්වයන් බලාත්මක කිරීම ප්‍රධාන උපක්‍රමික පියවරකි. මැතිවරණ දිනය දක්වා වූ කාලය තුළ සහ මැතිවරණ දිනයේදී බිම් මට්ටමේ වඩා වැඩි සහභාගීත්වයක් සහ පෙනී සිටීමක් මෙම කණ්ඩායම් විසින් සිදු කරනු ඇත.

ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණයක් සහතික කිරීම සඳහා පැෆරල් සංවිධානය වෙනත් ප්‍රධාන අංශ සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. ගාල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක වල ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණයක් සහතික කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ආගමික නායකයින් සහ ප්‍රධාන පෙළේ දේශපාලකයින් සමඟ හමුවක් ඉදිරි කාලයේදී පැවැත්වීමට සැළසුම් වී ඇත**.**

**මූලික නිරීක්ෂණ**

2014 දෙසැම්බර් මස 16 වන දින මධ්‍යම රාත්‍රිය වන විට සිදුවීම් 289 ක් හා සම්බන්ධ වූ මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ සිදුවීම් 336 ක් නිරීක්ෂණය වී ඇත. මේවා අතරට ප්‍රචණ්ඩ ක්‍රියා ද ඇතුලත්ය. මේ උල්ලංඝණය කිරීම් අතුරින් 290 ක් තහවුරු කරගත් සිදුවීම් වන අතර 46 ක් තහවුරු

නොවූ සිදුවීම්ය. පැෆ්රල් සංවිධානයේ වර්ගීකරණය අනුව එක් සිදුවීමක් තුළ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් කිහිපයක් අඩංගු විය හැකි බව මෙහිදී සඳහන් කළ යුතුය. ප්‍රචණ්ඩ සිදුවීම් අතරින් 73 ක් තහවුරු කරගත් සිදුවීම් වන අතර සිදුවීම් හයක් තහවුරු වී නොමැත. රාජ්‍ය දේපළ අයුතු ලෙස භාවිතා කිරීම සම්බන්ධ සිදුවීම් 76 ක් තහවුරු කරගත් සිද්ධි වන අතර 15 ක් තහවුරු කර නොගත් සිද්ධීන් වේ. රාජ්‍ය දේපළ සහ රජයේ සේවකයින් මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීම ,රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අලුත් පත්වීම් ලබාදීම සහ ස්ථාන මාරු ලබාදීම යන මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් ඉහත කී කාණ්ඩයට ඇතුලත් වේ. මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධ තෙවැනි කාණ්ඩයට දේශපාලන පක්ෂ වල කාර්යාල ගිනි තැබීම හා ඒවාට අලාභ හානි කිරීම , විරුද්ධවාදීන්ගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට බාධා කිරීම ඇතුලත් වන අතර මේ කාණ්ඩයට අයත් තහවුරු කරගත් උල්ලංඝණය කිරීමේ සිදුවීම් 141 ක් ද තහවුරු කරනොගත් පැමිණිලි 25 ක් ද පවතී.

සිවිල් සමාජය සහ දේශපාලන පක්ෂ විසින් විරෝධතා මතු කළ පසු කොළඹ නගරයේ සෑම වීදියකම පාහේ ප්‍රදර්ශනය කොට තිබූ සියලුම පෝස්ටර් සහ කටවුට් දැන්වීම් සැළකිය යුතු ප්‍රමාණයකින් ඉවත් කොට තිබෙනු පැෆ්රල් සංවිධානය සතුටින් යුතුව නිරීක්ෂණය කරයි. මැතිවරණ කොමසාරිස්වරයාගේ මෙහෙයවීම යටතේ පොලිසිය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ගය අප ප්‍රශංසාවට ලක් කරමු. නීතිඥ සංගමය විසින් මේ අරභයා ගනු ලැබූ ක්‍රියාමාර්ග ද අපගේ ඇගයීමට ලක් වේ. මෙය මැතිවරණ නීති නිසි ලෙස අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු රාජ්‍ය ආයතන වල ක්‍රියාකාරීත්වය ශක්තිමත් වීම සම්බන්ධ සාධනීය සංඥාවකි. කෙසේ වුවද වෙනත් නගර වල තවමත් පෝස්ටර් සහ කටවුට් ප්‍රදර්ශනය වෙමින් තිබේ. ඉහත ප්‍රශංසනීය ප්‍රවේශය වෙනත් ප්‍රදේශ වලටද ව්‍යාප්ත වීම සහතික කිරීම සඳහා අප අධිෂ්ඨාන සහගතව ක්‍රියා කරමු.

පසුගිය සතිය තුළ ප්‍රචණ්ඩ සිදුවීම් වල අඩු වීමක් නිරීක්ෂණය කළ හැකි වූ අතර මෙම සාධනීය තත්ත්වය දිගටම පවත්වා ගත යුතුය. කෙසේ වුවද මෙය තාවකාලික විරාමයක් පමණක් විය හැකි බවට සංඥා කෙරෙන  වෙනත් සාධක නිරීක්ෂණය කළ හැක. මැතිවරණ දිනය ආසන්න වන විට ප්‍රචණ්ඩ ක්‍රියා උත්සන්න වීමට තිබෙන සම්භාවිතාව පාලනය කිරීම සඳහා අවධාරණයෙන් වග බලා ගත යුතුය.

**විශේෂිත නිරීක්ෂණ**

**1. රාජ්‍ය දේපළ අයථා ලෙස පරිහරණය කිරීම**

පැෆ්රල් සංවිධානය රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිතා කිරීම සම්බන්ධ පහත සිදුවීම් නිරීක්ෂණය කරයි.

- **මැතිවරණය සමඟ සමගාමී වන ලෙස සුබසාධක ක්‍රියාකාරකම් සිදු වෙමින් පවතී.**

උදාහරණ -

රට පුරා සිටින සමෘද්ධිලාභීන් සඳහා විශේෂ සමෘද්ධි දීමනාවක් ලබා දී තිබීම

ගාල්ල ප්‍රදේශයේ නව ප්‍රතිලාභීන් සඳහා සමෘද්ධි කාඩ් පත් බෙදා දීම

ත්‍රිකුණාමලයේ සහ සේරුවිල ගොවීන් සඳහා නියං සහනාධාර ලබා දීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා බිත්තර වී ලබා දීම

උතුරු පළාතේ දී වතුර මෝටර් , මහන මැෂින් සහ කෘෂිකාර්මික උපකරණ බෙදා දීම

ගාල්ල රත්ගම ප්‍රදේශයේ මුලුතැන්ගෙයි උපාංග බෙදා දීම

- **මැතිවරණය ඉලක්ක කොට ගෙන විවිධ උපකරණ සහනදායී පදනම මත ලබාදීම.**

උදාහරණ - විශ්‍රාමිකයන් සඳහා ජංගම දුරකථන ලබා දීම ( මැතිවරණ කොමසාරිස්වරයාගේ මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය නතර කරන ලදී )

රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා සහනදායි වටිනාකමට යතුරු පැදි ලබා දීම

- **මැතිවරණ අරමුණු සඳහා රාජ්‍ය වාහන යොදාගැනීම.**

උදාහරණ -

2014 දෙසැම්බර් 11 වන දා අනුරාධපුරයේදී පැවැති එක්සත් ජනතා නිදහස් සන්ධාන රැළිය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ 1000 කට අධික ප්‍රමාණයක් යොදා ගැනීම

2015 දෙසැම්බර් මස 15 වන දා පානදුර දී පැවැත්වූ එක්සත් ජනතා නිදහස් සන්ධාන රැළිය සඳහා බස් 500 කට අධික ප්‍රමාණයක් යොදාගැනීම

එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් පෝස්ටර් ප්‍රවාහනය කිරීම සඳහා ධීවර සංස්ථාවට අයත් වාහන යොදාගැනීම

- **මැතිවරණ ප්‍රචාරක කාර්යාල ලෙස සහ ප්‍රචාරක කටයුතු සඳහා රජයට අයත් පරිශ්‍රයන් යොදාගැනීම. මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පැවැත්වීම සඳහාත් කටවුට් ප්‍රදර්ශනය කිරීම සඳහාත් රජයට අයත් පරිශ්‍රයන් භාවිතා කොට ඇත.**

**2. රාජ්‍ය අංශයේ සේවකයන් සහ බන්ධනාගාර රැඳවියන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල ශ්‍රමිකයින් ලෙස භාවිතා කිරීම**

- **මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය සේවකයින් , විශේෂයෙන් රාජ්‍ය ආයතන වල කම්කරු ශ්‍රේණියේ සේවකයන් යොදාගැනීම.**

උදාහරණ -

මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරු ශ්‍රේණියේ සේවකයන් පෝස්ටර් ඇලවීම සඳහා භාවිතා කිරීම.

අකුරැස්ස නගරයේ පැවැති මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් සඳහා අදාළ වේදිකාව ඉදිකිරීමටත් සැරසිලි කටයුතු සිදු කිරීමටත් බන්ධනාගාර රැඳවියන් යොදාගැනීම.

- **එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සිදු කිරීම සඳහා සහ ඔහුව ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශ සේවකයන් මෙහෙයවීම. රාජ්‍ය අංශයේ මණ්ඩලවල සහ අධිකාරීන්වල සේවකයන් මේ බලපෑම් වලට විශේෂයෙන් නතු වන සුලුය.**

උදාහරණ -

මැතිවරණ ප්‍රචාරක පරමාර්ථ සඳහා තරුණ සේවා නිලධාරීන් යෙදවීම.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ කාර්යාල සඳහා ස්වකීය අපේක්ෂකයා වෙනුවෙන් ප්‍රචාරක කටයුතු කරන ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධාන වෘත්තීය සමිති නායකත්වය විසින් ලබා දෙන ලද විස්තරාත්මක උපදෙස්.

**3. මැතිවරණ ප්‍රචාරක අරමුණු සඳහා රාජ්‍ය උත්සව උපයෝගී කොට ගැනීම**

මෙය එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාගේ මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රධාන අංගයක් වී තිබේ. මැතිවරණ ප්‍රචාරක අරමුණු සඳහා වූ වේදිකාවක් වශයෙන් රාජ්‍ය උත්සව උපයෝගී කොට ගනිමින් පවතී.

උදාහරණ -

සාලමුල්ල ප්‍රදේශයේ නිවාස සංකීර්ණයක් විවෘත කිරීම

විශ්ව විද්‍යාල සිසුන් සඳහා මහපොළ දීමනා ලබා දීමේ උත්සවය

ඇඹිලිපිටිය ප්‍රදේශයේ මහජන පොළක් විවෘත කිරීම

**4. ප්‍රධාන පෙළේ රාජ්‍ය අංශ ආයතන වල සිදු කෙරෙන ස්ථාන මාරු කිරීම් සහ නව පත් කිරීම්**

උදාහරණ -

පොලිසිය -

පොලිස්පතිවරයාගේ අදහස් නිසි ලෙස විමසීමකින් තොරව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍යංශයට අලුතින් පත් කළ ලේකම්වරයා විසින් මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමට ආසන්න කාලය තුළ සිදුකළ ස්ථාන මාරු වීම් 500 කට ආසන්න ප්‍රමාණය.

නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍යංශයට අලුතින් පත් කළ ලේකම්වරයා විසින් පොලිස්පතිවරයා මඟ හැර නව ස්ථාන මාරු කිරීම් සිදු කොට ඇත. පොලිස් සැරයන්වරු උප පොලිස් පරීක්ෂකවරු දක්වා උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, අලුත්ගම පොලිසියේ ස්ථාන භාර නිලධාරීවරයාට ස්ථාන මාරුවක් ලබා දීම සහ වේයන්ගොඩ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරීවරයාට ස්ථාන මාරුවක් ලබා දීම මීට ඇතුලත් වේ.

ගුරු පත්වීම් - රාජ්‍ය අධ්‍යාපන අංශය සඳහා පුද්ගලයින් 210 දෙනෙක් අලුතින් බඳවා ගන්නා ලදී.

තරුණ - ක්‍රීඩා අමාත්‍යංශය විසින් ක්‍රීඩා නිලධාරීන් පත් කිරීම සඳහා උත්සාහයක් පැවැති අතර මෙය පසුව අත්හිටුවන ලදී.

**5. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂකයා සඳහා වන මැතිවරණ ප්‍රචාරක අවකාශය සීමා කිරීම**

උදාහරණ -

එක්සත් ජනතා නිදහස් සන්ධාන පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතන පොදු ස්ථාන සඳහා වූ ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම - රුවන්වැල්ල සහ අකුරැස්ස ප්‍රාදේශීය සභා සහ තලාව මහජන ක්‍රීඩාංගනය ලබා නොදීම

කොත්මලේ පැවැති නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු අපේක්ෂකයාගේ රැස්වීම සඳහා වූ විදුලිය විසන්ධි කිරීම සහ රැස්වීමට සහභාගී වීමට පැමිණෙමින් සිටි පිරිස් රැගත් වාහන වලට බාධා කිරීම.

ගම්පහ ප්‍රදේශයේ නව ප්‍රජාතන්ත්‍රවදී පෙරමුණු රැස්වීමට බාධා කිරීම.

මහනුවර දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ දේශපාලනඥ චිත්‍රා මන්තිලකට මරණ තර්ජන එල්ල කළ බවට චෝදනා ඉදිරිපත් වීම

**6. එක්සත් ජනතා නිදහස් සන්ධාන මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය මාධ්‍ය පූර්ණ වශයෙන් උපයෝගී කොට ගැනීම.**

ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා රාජ්‍ය මාධ්‍ය ඉතාම ඉහළ මට්ටමකින් උපයෝගී කොට ගැනෙමින් තිබෙන අතර මෙය විපක්ෂය සඳහා ලැබෙන මාධ්‍ය ආවරණය අබිබවා ගිය ප්‍රචාරණයකි.

**7. සාංසිද්ධික සහ සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය**

පුපුරන ද්‍රව්‍ය යොදාගෙන සිදු කළ පහරදීම් වල සිට බරපතල අඩත්තේට්ටම් කිරීම් , වෙඩි තැබීම්, තර්ජනය කිරීම් සහ ගිනි අවි යොදාගෙන සිදු කරන බිය වැද්දීම් දක්වා පරාසයක විහිදෙන ප්‍රචණ්ඩ සිදුවීම් වාර්තා වී තිබේ. කෙසේ වුවද පසුගිය සතියේ මෙබඳු සිදුවීම් වල යම් අඩු වීමක් දැකිය හැකි වන අතර එසේ වුවත් එම අඩු වීමේ ප්‍රවණතාවය දිගටම පවතිනු ඇද්ද යන්න අවිනිශ්චිතය. මැතිවරණ දිනය ආසන්න වන විට ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා වන පෙළඹීම ඉහළ යාමට තිබෙන සම්භාවිතාවය වලක්වා ගත යුතුය.

උදාහරණ -

බරපතල අඩත්තේට්ටම් කිරීම් - තලාව ප්‍රදේශයේ දී නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය ප්‍රකාශ කිරීම සමරමින් සිටි තරුණයෙක් තලාව ප්‍රාදේශීය සභා සභාපති ටී.එම්. ඉන්දික උදයකුමාර සහ තවත් අය විසින් පොරොවකින් සහ පොලු වලින් සිදු කළ පහර දීමකට ලක් විය.

පේරාදෙණිය වැලිගල්ලේදී එක්සත් ජනතා නිදහස් සන්ධාන පාක්ෂිකයෙක් ප්‍රචාරක කාර්යාලය තුළ දී අඩත්තේට්ටම් කිරීමට ලක්විය.

වෙඩි තැබීම් - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය ප්‍රකාශ කිරීම සමරමින් රතිඤ්ඤා පත්තු කරමින් සිටි පුද්ගලයින් සමූහයකට නාඳුනන තුවක්කුකරුවෙක් විසින් වෙඩි තබන ලදී.

මැතිවරණ ප්‍රචාරක කාර්යාල වලට සිදු වූ පහර දීම් - හම්බන්තොට එක්සත් ජනතා නිදහස් සන්ධාන ප්‍රචාරක කාර්යාලයක් පහර දීමට ලක්වූ අතර එම පරිශ්‍රයට අලාභ හානි සිදුවිය.

**සාර්ථක මැදිහත්වීම්**

- **රාජ්‍ය ආයතන හරහා සිදු කළ සෘජු මැදිහත්වීම්**

- පොලිස්පතිවරයා - පොලිස් නිලධාරීන් 10 000 කට අදාලව යෙදී තිබූ ස්ථාන මාරු කිරීම් මැතිවරණය අවසන් වනතෙක් නතර කිරීම

- මැතිවරණ කොමසාරිස්වරයා - මැතිවරණ කාලය තුළ සිදුකිරීමට උත්සාහ කළ නව ක්‍රීඩා නිලධාරීන් සඳහා පත්වීම් ලබා දීම නතර කිරීම, මැතිවරණ රැළි වලට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම සීමා කිරීම සහ රත්නපුර හා ඇඹිලිපිටියේ රැස්වීම් සඳහා යොදාගත් බස් රථ සම්බන්ධ ගණනයක් ඉල්ලා සිටීම.

- ඕපනායක වැලිගපොල හා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ( මැතිවරණ නීති උල්ලංඝනය කෙරෙන ලෙස )මැතිවරණය හා සම්බන්ධ රැස්වීම් පැවැත්වීමෙන් රාජ්‍ය නිලධාරීන් වැලැක්වීම.

- **මාධ්‍ය හරහා සිදු කළ අනාවරණය කිරීම්**

- එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් රට පුරා පෝස්ටර් ඇලවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් යෙදවීම පැෆරල් සංවිධානය විසින් මාධ්‍ය වෙත ලබා දුන් වාර්තා වල ප්‍රතිඵලයක් ලෙස අත්හිටුවන ලදී.

**මහජනයා වෙත කෙරෙන ඉල්ලීම**

මැතිවරණයක් තුළ මහජනයා සතු භූමිකාව හුදෙක් ඡන්දය භාවිතා කිරීමෙන් ඔබ්බට විහිදෙන්නකි. නිදහස් ඡන්දයක් සඳහා වූ පරිසරය ආරක්ෂා කරගැනීම එකී ඡන්දය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාවලියේම කොටසක් වන්නේය. මැතිවරණය සහ මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලිය නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වෙන බවට වගබලා ගැනීම සඳහා මැතිවරණ නිරීක්ෂකයින් විසින් ගෙන යන ක්‍රියාවලිය සමඟ මේ නිසා මහජනතාව සම්බන්ධ විය යුතුය. මේ නිසා අප මහජනයාගෙන් පහත දෑ ඉල්ලා සිටිමු.

1. ඔබගේ ඡන්දය භාවිතා කරන්න.

2. ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය,වලංගු විදේශ ගමන් බලපත්‍රය, පූජ්‍ය පූජක හැඳුනුම්පත, විශ්‍රාමික හැඳුනුම්පත , ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත , මැතිවරණ සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත්‍ර (2012 පළාත් සභා ඡන්ද විමසීම් සඳහා නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත් මේ සඳහා නැවත වලංගු කරවා ගත යුතුය. අනන්‍යතාව තහවුරු කරන නිසි ලියැවිල්ලක් ඔබ සතු නොවේ නම් ඔබගේ ග්‍රාම නිලධාරීවරයා මුණ ගැසී තාවකාලික අනන්‍යතා ලේඛනයක් ලබාගන්න.

3. ප්‍රචණ්ඩ ක්‍රියා සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිදුවීම් වලට සම්බන්ධ නොවන්න.

4. ස්වකීය ප්‍රදේශය තුළ යම් මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිදුවීමක් සිදු වේ නම් ඒ පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයා සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුවත් කරන්න.

5. ඔබේ ඡන්ද පොල ආරක්ෂා කර ගැනීම ඔබගේ ද වගකීමකි.